ආසියාවේ පළවන එකම කතෝලික ළමා පුවත් පත
LP - QD / 21/ News/ 2012

# ළමා ප්‍රදීපය

ක්‍රි. ව. 2012 මාර්තු 26 සඳුදා
04 වෙළුම - 22 කලාප
සතිපතා පත්‍රය - පිටු 16
මිල රු 10.00



## ග්‍රාබියෙල් දේව දූතයා මරියතුමියට මංගලම් කීම

ළමා ප්‍රදීපය

ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - 2695984 / 4899611
ෆැක්ස් : 2692586 - ඊ-මේල් pradeepaya@yahoo.com
වෙබ් අඩවිය - www.colombocatholicpress.lk

# දේව මාතාවන්ට මංගලම් කීමේ මංගල්‍යය.

## ආදරණීය දුවේ පුතේ...

මේ චතාරික සමයේ තවත් එක් විශේෂ මංගල්‍යයක් ජන වන්දනා ලිත තුළ දකින්නට පුළුවන්. ඒ මංගල්‍යය තමයි, සමිඳුණන් වහන්සේගේ මාංශගතවීමේ මංගල්‍යය හෙවත් දේව මාතාවන්වහන්සේට මංගලම් කීමේ මංගල්‍යය වශයෙන් නම් කොට තිබෙන්නේ. දේව මාතාවන් වහන්සේ දෙවි පියාගේ කැමැත්තට හිස නමමින් වචනයෙන්ද, ක්‍රියාවෙන්ද දෙවි සමිඳුන්ට ඔබින වාසස්ථානයක් බවට පත්වුවා.

''නමෝ මරියනි, ප්‍රිය ප්‍රසාද පූර්ණවන්තියනි, ස්වාමින් වහන්සේ ඔබ කෙරෙහිය..........'' ග්‍රාබියෙල් දේව දූතයා මේ මහා මංගල පුවත රැගෙන ආවේ දෙවි පියාණන් වහන්සේට දැඩිව ආදරය කල, දෙවි පියාණන් වහන්සේගේ කැමැත්ත අනුව ජීවිතය හැඩ ගස්වා ගෙන ජීවත් වූ සාමාන්‍ය සරල තරුණියක වූ මරියාවන් වෙතයි.

ආදර දුවේ පුතේ,

දැන් ඔබ ඔබේ කතෝලික විශ්වාසය තුළ ශුද්ධවූ සුවිශේෂයේ අඩංගු මේ කරුණු තේරුම් ගන්නට උත්සහ ගන්නට ඕනා. පුරාණ ගිවිසුමේ අපි දකිනවා, දෙවි මිනිස් සම්බන්ධතාවය බිඳ වැටෙන අයුරුත්, පාපය නිසා මිනිස් ජීවිතය අඳුරු වූ අයුරුත් කෙලෙස සිදු වුවාද කියා. පැරණි ගිවිසුම තුළ පළමු ස්ත්‍රිය වූ ඒවගේ ක්‍රියාදමය හේතු කොට ගෙන පාපයේ බීජය මේ පොලෝ තලය මත පතිත වුනා. පළමු මිනිසා වන ආදම් නිසාත් පළමු ස්ත්‍රිය වූ ඒව නිසාත් පාපයේ බීජය දළු ලා වැඩෙත්ම අකීකරු කම හා උඩගුකම තුළ මනුෂ්‍යයා දෙවිදුන්ගෙන් ඈත් වුවා.

මෙලෙස ඈත්වූ දෙවි මිනිස් සම්බන්ධතාවය නැවත ගොඩ නගන්නට දෙවි පියාණන් වහන්සේම ගැලවීමේ ක්‍රියාවලියට මුල පුරනවා. ඒ අනුව නව ගිවිසුම තුළ නව ආදම් සහ ඒව බිහිවීම අපට දකින්නට පුළුවන්. නැතිවී ගිය දෙවි මිනිස් සම්බන්ධතාවය නැවත ගොඩ නැගෙන්නෙ නව ආදම් හැටියට ජේසුස් ස්වාමින් වහන්සේත් නව ඒව හැටියට මරිය වහන්සේත් ස්වකීය දිවි මඟ තුළ දේව කැමැත්ත ඉටු කිරීමට බැහැපත් වූ නිසා යි. මිනිස් බව තුළින් දේව පුත්‍රයානන් මෙලොව බිහිවීම මෙම ක්‍රියාදමයේ උතුම්ම අවස්ථාව ලෙස දක්වා ලන්නට පුළුවන්. යෙසයා දිවැසිවරයා පුරාණ ගිවිසුමේ දක්වාලන දිවැසාවලිය වන්නේ මෙයයි. ''බලන්න, කන්‍යාවක් ගැබ් ගෙන පුතෙකු බිහිකරන්නීය. උන්වහන්සේට 'එම්මානුවෙල්' යන නාමය තබනු ඇත.'' එලෙසම නව ගිවිසුමේ ශු. ලුක් තුමාගේ සුවිශේෂයේ ග්‍රාබියෙල් දේව දූතයා මරියාවන්ට මංගලම් කීම තුළ එම දිවැසාවලිය ස්ථිර කරනු ලබනවා. දේව සැලැස්ම අනුව ගැලවීමේ ක්‍රියාවලිය ආරම්භ කරමින් ඒ මොහොතේ මරියාවන් ප්‍රකාශ කරන්නේ; ''මේ මම ස්වාමින් වහන්සේගේ දාසිය වෙමි, ඔබ කී වචනය ලෙස මට සිදුවේවා'' යන්නයි. ශුද්ධවූ මතෙව් තුමාගේ සුවිශේෂයේ එය තවත් පැහැදිලි කරමින් පවසන්නේ ජේසුස් ස්වාමින් වහන්සේ මාංශගත වන්නේ ආදි පිතෘ යුගය අවසන් කර ගැලවීමේ ක්‍රියාවලිය ආරම්භ කරමින් කාලය සම්පූර්ණ කල මරිය තුමියගෙන් බවයි.

'එම්මානුවෙල්' - ''දෙවියන් වහන්සේ අප සමඟය'' යන්න එළිදරව් කරමින් ජේසුස් ස්වාමින් වහන්සේ මෙලොව මනු බව ලබන්නේ ඒ ප්‍රකාශිත ගැලවීමේ ක්‍රියාවලිය මුළුමහත් ලොව කරා ගෙන යාමටයි.

ආදර දුවේ පුතේ,

ලෝකාරම්භයේදී පළමු ස්ත්‍රියගේ අකීකරුකම හා උඩඟුව නිසා මෙලෝතලයේ පැතිර ගිය පාපය නව ගිවිසුමේ නව ඒව වන මරියාවන්ගේ කීකරුකම හා බැහැපත් කම නිසාද, වචනයේ දාසිය ලෙස සිය දිවි සම්පූර්ණයෙන්ම දෙවි සමිඳුන්ට පුද දීම තුළින්ද ඇය දේව කැමැත්ත මුළු මනින්ම ඉටු කිරීමෙන් දුරස් කල බව පැහැදිලියි. ඒ තුළ ධර්මයාණන් වූ ජේසුස් ස්වාමින් වහන්සේගේ ගැලවීමේ ක්‍රියදමයට එතුමිය සෘජුවම දායක වුවා. දේව කැමැත්ත අනුව හිස්වී අප කුඩා ජීවිතත් දෙවිඳුන් හා ඒකාබද්ධ කිරීමට මෙයින් අපට අගනා ජීවිත පාඩමක් ගෙන හැර දක්වනවා. එය ප්‍රේමයේ සාක්ෂ්‍යය කර ගන්නට පුංචි ඔබත් දහමින් දිනපතා වර්ධනය විය යුතුයි.

ඔබ සැමට ජේසු පිහිටයි !

සංස්කාරක
ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා

ළමා ප්‍රදීපය පාස්කු කලාපය .....
ළමා ප්‍රදීපය පාස්කු කලාපය අප්‍රේල් 02 වන දින
(ලබන සතියේ) නිකුත් කෙරේ.....

# මෙවර පාසල් ක්‍රිකට් වාරයේදී මොරටුව සා. සෙබස්තියන් ක්‍රීඩකයෝ ඉදිරියෙන්ම

සී/ස ඩයලොග් ආසියාටා සමාගමේ පූර්ණ අනුග්‍රහය යටතේ ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් සංගමය හා සීමාසහිත මාස්කොම් සමාගම එක්ව සංවිධානය කළ ඩයලොග් ''යූත් 19'' මෙවර අන්තර් පාසල් ක්‍රිකට් තරඟාවලියේ පළමු වටයේ කාණ්ඩ 4 ක් යටතේ පාසල් 36 ක් තරඟ බිමට එක් වූහ.

මෙහිදී ''සී'' කාණ්ඩ යෙන් තරඟ වැදුනු මොරටුව සා. සෙබස්තියන් විදුහල් වයස අවු. 19 පහළ ක්‍රිකට් කණ්ඩායම මෙම අංශයෙන් ශූරතාවය ලබා ගැනීමට සමත්වුණි. ශ්‍රී ලංකා යොවුන් පිල නියෝජනය කළ තුන් ඉරියව් ක්‍රීඩක, කණ්ඩායම් නායක අමිල අපෝන්සුගේ නායකත්වයෙන් තරඟවැදුණු මොරටුව සා.



කණ්ඩායම් නායක අමිල අපෝන්සු

සෙබස්තියන් ක්‍රීඩකයෝ තරඟ 8 කට සහභාගී වී පූර්ණ ජයග්‍රහණ 4ක් ලැබූහ.

තරඟ 3 කදී මුල් ඉනිමේ ජයග්‍රහණ වාර්තා කල අතර එක් තරඟයක් පමණක් පරාජයට පත්විය. ප්‍රසාද ලකුණු සටහනේද ලකුණු 126.85 ලබමින් දෙවෙනි වූයේ ''ඒ'' කාණ්ඩයේ ශූරතාවය දිනූ මහනුවර ත්‍රිත්ව විද්‍යාලයට පමණි.

කණ්ඩායම මෙහෙය වූ අමිල කඩුලු 107 දවාගනිමින් මෙවර පාසල් ක්‍රිකට් තරඟාවලියේදී කඩුලු සියයක් ලැබූ ක්‍රීඩකයින් කිහිප දෙනා අතරට එක් වීම කැපී පෙනෙන්නකි. වාර්ෂික පාසල් මහ ක්‍රිකට් තරඟාවලියේ (62 වැනි මොරටු රන් හටන) ඉනිම දෙකෙදිම කඩුලු 8 ක් ලබා ගනිමින්. (පළමු ඉනිම ලකුණු 54 /6 හා දෙවෙන ඉනිමේදි ලකුණු 54/2) මෙම දක්ෂතාවය මත මෙවර වාර්ෂික ක්‍රිකට් තරඟාවලියේ හොඳම පන්දු යවන්නා සම්මානය දිනාගැනීමටද මොහු සමත් විය.

**ශ්‍රී ලංකා යොවුන් පිල නියෝජනය කළ තුන් ඉරියව් ක්‍රීඩක කණ්ඩායම් නායක අමිල අපෝන්සුගේ නායකත්වයෙන් තරඟවැදුණු මොරටුව සා. සෙබස්තියන් ක්‍රීඩකයෝ තරඟ 8 කට සහභාගී වී පූර්ණ ජයග්‍රහණ 4 ක් ලැබූහ. තරඟ 3 කදී මුල් ඉනිමේ ජයග්‍රහණ වාර්තා කල අතර එක් තරඟයක් පමණක් පරාජයට පත්විය**

මෙවර වාර්ෂික මහ ක්‍රිකට් තරඟාවලියේදී (දෙදින) වැඩි ගෞරව දිනා ගතිමින් එක් දින තරඟයද ජයග්‍රහනය කරා තම පිල මෙහෙය වූ කණ්ඩායම් නායක අමිල අපොන්සු ඇතුළු මෙවර තරඟ වාරයේදී කැපී පෙනෙන දස්කම් පෑ මොරටුව සා. සෙබස්තියන් ක්‍රිකට් කණ්ඩායමට ළමා ප්‍රදීපය සුබ පැතුම් .

**කුමර නයනජිත්**

# නාගොඩ දහම් ළමුන්ට ලේඛක වැඩමුළුවක්

කඳන, නාගොඩ ශ්‍රී. ස්නාවක ජුවාම් දහම් පාසලේ ළමුන් සඳහා ළමා ලේඛක වැඩමුළුවක් පසුගියදා දෙව්මැදුරු ශාලාවේදී පැවැත්වුණි. ළමුන්ගේ ලේඛක කුසලතාවයන් ඔප් නැංවීම සඳහා පැවති මෙයට 9 සිට 11 ශ්‍රේණිය දක්වා ළමෝ සහභාගී වූහ. මෙය මෙහෙයවනු ලැබුවේ ළමා ප්‍රදීපය සහය සංස්කාරක, දේශක කුමර නයනජිත් මහතාය.





පුවත්පත් කලාව, ප්‍රයෝගික අභ්‍යාසයේ අවස්ථාවක්

නාගොඩ මීසම් සේවක ගරු රන්ජන් සිල්වා පියතුමාගේ අනුශාසකත්වයෙන් ආචාර්ය මඩුල්ලේ නිලංගිකා රොෂානි ලිවේරා මහත්මියගේ සම්බන්ධී කරණයෙන් මෙය පැවැත්වුණි.

මෙදින සහභාගීවු ළමුන්ට දේශනයෙන් පසු අභ්‍යාසයක් ලබාදුන් අතර ඉන් සාර්ථක නිර්මාණ ළමා ප්‍රදීපය තුළ පළකිරීමට කටයුතු යෙදීම ළමුන්ට ලැබුණු විශේෂිතවු අවස්ථාවකි. මෙදින අවස්ථාවන් සේයාරුවෙහි දිස්වේ

**නෙළුම් සිල්වා - නාගොඩ**

# මීගමුව ශා. ජෝශප් ශාබා විදුහලේ නව ගොඩනැගිල්ල විවෘත වුද එහි සිසු දරු දැරියන්ගේ නිර්මාණ හැකියාවන් එළි දැක්වූ අයුරු









# ඔබ අන් අය ගැන සිතනවාද?



## බයිබලයයි පුංචි මමයි

ගරු එස්. රන්දිල් ප්‍රනාන්දු (නි.ම.නි) පියතුමන් විසිනි

දයාබර දුවේ පුතේ, මෙවර ඔබගේ අවධානයට සහ භාවනාවට තවත් බයිබල් පාඨයක් රැගෙන ආවෙමි.

හිතෝපදේශකයාගේ පොතේ 27 වන පරිච්ජේදයේ 14 වන වගන්තියේ මෙසේ ලියා ඇත.

''ආචාර කිරීමට සිය මිතුරා අලුයම අවදි කිරීම ඔහුට ශාප කිරීමක් වැනිය.''



ඔබ වටේ බොහෝ දන්න හඳුනන නෑදෑ හිත මිතුරන් සිටින බව ඇත්ත කරුණකි. ඔවුනට වුවද විවේකය හා පුද්ගලික බවක් ඇත. ඔබ වෙනුවෙන් කාලය දීමට නිතරම ඔවුනට අපහසුය. ''ආචාර කිරීම'' හොඳ දෙයකි. එහෙත් එය බලෙන් හෝ බලහත්කාරයෙන් හෝ නොකරන්නට වගබලා ගන්න. ඔබ ඉදිරියට හමුවන දන්න නොදන්න සැමට ම එක සේ ආචාර කරන්න.

එය ඔවුනගේ දවසේ ආරම්භයටත් ඔබ ගැනත් හොඳ සිතුවිල්ලක් තබා ගැනීමට සහය වනු ඇත. ඔබත් නිතර තව කෙනෙකුට කරදරයක් නොවන පරිදි ජීවත් වන්නට උත්සාහ ගන්න. එවිට ඔබටද ඔවුන් කරදරයක් නොවනු ඇත. තවද ඔවුන් ඔබට එවිට ශාප නොකර ශුභාශිංසන අරගෙන ඒවි. පුංචි ඔබත් දැන්ම පටන් එසේම කරන්න පුරුදු වන්න.

## තාත්තාගේ ආදරය .......

දස මසක් කුසේ දරාගෙන නොවැදුවත්
දිවා රෑ වෙහෙස නොබලා
මගේ අනාගතය උදෙසා සැම දෙයක්ම
පිළිවෙලට සකසා තබාගෙන කටයුතු කළේ
මට තිබෙන ආදරය නිසා නොවේද?
සමාජයේ මිනිසුන් සමගත්
මගේ පවුලත් සමග හොඳින් ජීවත් වුණු
මගේ තාත්තා මගෙන් වෙන් වුනේ කුමක් නිසාද?
ඔබ මට දක්වනු ලැබූ ඔබගේම
ආදරණීය උණුසුම, රැකවරණය , ආදරය මා
කාගෙන් ලබන්නේද? මේ මුළු ලෝකයේම සිටි,
මාළඟ තවත් ජීවත් වන, සදා අමරණීය
පියාණන් ඔබ නොවේද?
ඔබගේ ආදරය හදවතකින්
හදවතකට ගලා ගෙන පිරිසිදු රුධිරය මෙනි.
මාගේ ජීවිතයේ සදා අමරණීය පිළිරුවකි ඔබ.

(කුරුණෑගල පදවියේ 25 වන ජයන්තිය නිමිත්තෙන් සංවිධානය කෙරෙන ''පියවරුන්ගේ දිනය'' නිමිත්තෙනි)

**පී. ශෂිකලා මධුවන්ති**
6 ශ්‍රේණිය
ශු. ඇග්නස් දහම් පාසල - පන්නල



මාසික සිතිවිල්ල

මෙහි පළවන සේයාරුවට ගැලපෙන පරිදි ඔබගේ අලංකාර ගද්‍ය හා පද්‍ය නිර්මාණය අප වෙත යොමු කරන්න. ඔබ එවන නිර්මාණය සමග ඔබේ නම, ලිපිනය, ශ්‍රේණිය, පාසල, දහම් පාසල හා දුරකථන අංකය ද පැහැදිලිව ලියා පහත ලිපිනයට යොමු කරන්න.

**මාසික සිතිවිල්ල**
"මාර්තු මාසය"
ළමා ප්‍රදීපය, අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත,
කොළඹ 08.

# 2012 අ.පො.ස. සා. පෙළ කතෝලික ධර්මය පුනරීක්ෂණ පාඩම් මාලාව

## ශ්‍රී ලාංකීය කිතුනු ඇදහිල්ල.

ඉදිරිපත් කිරීම
ගරු ඩේමියන් පෙරේරා
පියතුමන් විසිනි.

★ පෘතුගීසි ධර්මදූත සේවා මෙරට සාර්ථක වීමට බලපෑ හේතු කවරේද?

- පෘතුගීසි ධර්දූතවරු ලාංකීය ජන ජීවිතයට ඉතා සමීප පිරිසක් වීම
- දේශිය භාෂා ඉගෙනගෙන ධර්මය ප්‍රචාරය කිරීම
- ධීවර ජනාවාස ප්‍රදේශවලින් ධර්ම ප්‍රචාරක කටයුතු ඇරඹීම.
- සියලුම ජන කොටස්වලට එක හා සමාන ලෙස සැලකීම
- සරල අල්පේච්ඡ ජීවිතය

★ පෘතුගීසි සමයේ ප්‍රථම ධර්මදූත කණ්ඩායම ලෙස මෙරට සේවය කළ පැවිදි නිකාය කුමක් ද?

- ප්‍රැන්සිස්කන් පැවිදි නිකාය.

★ ශ්‍රී ලංකාවේ කිතුනු ඇදහිල්ල පණ ගැන්වූ පෘතුගීසි සමයේ පුරෝගාමී පැවිදි නිකායන් නම් කරන්න.

- ප්‍රැන්සිස්කන් පැවිදි නිකාය
- ජේසු නිකාය
- දොමිනිකානු නිකාය
- අගුස්තීනු නිකාය

★ ලන්දේසීන් විසින් කතෝලිකයන්ට ඇති කළ පීඩන ප්‍රතිපත්ති කවරේද ?

- කතෝලික පූජකවරු රහසින් සැඟවී සිට හමුවුවහොත් මරණ දණ්ඩනය නියම කිරීම
- සියලුම කතෝලික ධර්මදූතවරුන් පිටුවහල් කිරීම
- කතෝලික සභාව සතු දේපල රාජ්‍ය සන්තක කිරීම
- ලන්දේසි පාසල්වල රෝමානු කතෝලික ධර්මය ඉගැන්වීම තහනම් කිරීම. ඒ වෙනුවට සියලුම දරුවන්ට ඕලන්ද රෙප්‍රමාදු ධර්මය ඉගැන්වීම
- රෙප්‍රමාදු දෙව් මැඳුරුවල බෞතීස්මය නොලැබූ අයගේ උපත් ලියාපදිංචි නොකිරීම

★ ලන්දේසි පීඩන සමයේ මෙරට කතෝලික විශ්වාසය රැකදුන් පියතුමා කවුද? ලංකාවේ අපෝස්තුළුවරයා යන විරුදාවලියෙන් හඳුන්වන්නේ කවුරුන්ව ද?

- ජුසේවාස් පියතුමා - ඔරතෝරියානු නිකාය

★ ලන්දේසි පීඩන සමයේ මෙරට කතෝලිකයන්ගේ විශ්වාසය රැකදුන් පැවිදි නිකාය කුමක් ද?

- ඔරතෝරියානු නිකාය

★ ජුසේවාස් පියතුමා ශ්‍රී ලාංකීය අපට වැදගත් වන්නේ ඇයි?

- මෙරට කතෝලියන් ලන්දේසීන්ගෙන් පීඩා විඳින විට කතෝලිකයන්ගේ විශ්වාසය ආරක්ෂා කිරීමට ජීවිත පරදුවට තබා කරන ලද කැපවීම නිසා
- ජුසේවාස් පියතුමා ලන්දේසි පාලන සමයේදී මෙරට කතෝලිකයන් අතරට නොපැමිණියේ නම් මෙරට කතෝලික ජනතාව සහමුලින්ම නැති වී යනු ස්ථිරය. එබැවින් එතුමා අපට වැදගත් වේ.

★ ජුසේවාස් පියතුමාගේ ජීවිතය හා බැඳී ප්‍රාතිහාර්ය මොනවාද ?

- නියන් කාලය තුළ යාච්ඤා කර වැසි ලබාදීම
- ඇඳුරු ඔයෙන් පාගමනින් එතෙර වීම
- පුත්තලම ප්‍රදේශයෙහි තනි අලියෙකු මෙල්ල කිරීම

★ ලන්දේසි පීඩන සමය තුළ සිංහල කතෝලික සාහිත්‍යයක් බිහිකිරීමට පුරෝගාමී වූ ඔරතෝරියානු පියතුමා කවුද?

- ජාකෝමේ ගොන්සාල්වෙස් පියතුමා (ලක්දිව කතෝලික සාහිත්‍යයේ පියා)

★ ශ්‍රී ලංකීය සංස්කෘතිය තුලින් බිහි වූ දේශිය පැවිදි පන්ති තුනක් නම් කරන්න.

- සුරදූත නිකායික පැවිදි සොයුරියෝ
- ජලමාල නිකායික පැවිදි පියවරු හා පැවිදි සොයුරියෝ

★ ලාංකීය ක්‍රිස්තියානි සභාව දේශානුරූපී වීම සඳහා ගෙන ඇති පියවර නම් කරන්න.

- දේශීය භාෂාවන්ගෙන් ජනවන්දනාව පැවැත්වීම.
- ගීතිකා සඳහා ජන ගී ආර යොදාගැනීම.
- ජන වන්දනා මෙහෙයන් සඳහා දේශිය සැරසිලි යොදා ගැනීම. උදා:- ගොක්කොළ , පුන් කලස පොල්තෙල් පහන
- දේශීය සංස්කෘතියට ගැලපෙන පරිදි ජනවන්දනාවේ ඇඳුම් පැළඳුම් සකස් කර ගැනීම.
- දේශීය සංස්කෘතිකාංග ජනවන්දනාවට යොදාගැනීම
- දේශීය ගෘහ නිර්මාණ ශිල්පීය ක්‍රම අනුව දේවස්ථාන ගොඩනැගීම

# ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ

ජේසුස් වහන්සේ යනු මුළු මිනිස් සංහතියම පාපයෙන් ගලවා ගැනීමට දෙවියන් වහන්සේ විසින් අප වෙත ඒවා වදාළ තැනැන් වහන්සේය. ආදි මව් පියන් කළ වැරදි හේතුවෙන් පාපයට වැටුණු මිනිසා පාපයෙන් මුදා ගන්නටත් බිඳුණු දේව සබඳතාවය යළි ගොඩනැංවීම සඳහාත් මෙලොවට පැමිණි ක්‍රිස්තුන් වහන්සේ භෞමික හා ස්වර්ගීක යන දෙකෙන්ම පරිපූර්ණ වූ සේක.



ජේසුස් වහන්සේ ද මිනිස් අප මෙලොව උපත ලබා සාමාන්‍ය මිනිසකු ලෙස වර්ධනය විය. එමෙන්ම උන්වහන්සේට ද සාමාන්‍ය මිනිසකු සේ කුසගිනි දැණිනි. එදා පාළුකරයේ දින සතලිහක් නිරාහාරව යාච්ඤා කරන විටදී උන්වහන්සේට කුසගිනි දැණිනි. තවද උන්වහන්සේ තම අවසාන මොහොතේ දී මල්උයනේ යාච්ඤා කරන විට ඉදිරියේදී එළඹීමට යන හෝරා කිහිපය පිළිබඳව බියක් දැණිනි. මන්ද උන්වහන්සේ පාවා දීමට යන තම ශ්‍රාවකයකු වන ජුදාස් සමඟ පැමිණෙන ජුදෙව් හේවායන් අතට පත්ව විනිශ්චය කරනු ලැබූ කුරුස ගසේ මරණයට නියම වන බව දන්නා නිසාවෙනි.

එලෙසම ජේසුස් වහන්සේ මානසිකව ද ශරීරිකව ද මිනිසකු සේ වේදනා විඳි සේක. තමාව පාවා දීමට යන ජුදාස් කළ දෙය පිළිබඳව ද නායක පූජකයන් ඉදිරියේ විඳින්නට සිදුවන නින්දා අපහාස පිළිබඳව ද තමා කෙතරම් ප්‍රේම කල ද තම ජනයා කමාව ප්‍රතික්ෂේප කිරීම පිළිබඳව උන්වහන්සේ මානසිකව දුක් වූ සේක.
එසේම කසපහර විඳිද්දි කුරුස ගසේ ඇණ ගසද්දී උන්වහන්සේ ශාරීරිකව ද ඉමහත් වේදනවාක් විඳි සේක. කුරුස ගසේදී තම අන්තිම ලේ බිඳුව දක්වාම උන්වහන්සේ තම ජනතාව වෙනුවෙන් දුක් විඳිද්දී උන්වහන්සේට පිපාස වූ බව ද ශුද්ධ ලියවිල්ලෙහි සඳහන් වේ. මෙවැනි සියළු අවස්ථාවල් පිළිබඳව සලකා බැලීමේදී ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිතය භෞමිකත්වය යන ගුණාංගයෙන් පරිපූර්ණ වී තිබූ බව පැහැදිලි වේ.

එලෙසම ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිතය ස්වර්ගීකද වන සේක. උන්වහන්සේ මරිය තුමිය මඟින් මෙලොවට පැමිණිය ද උන්වහන්සේ දේව පුත්‍රයා වන සේක.

දෙවියන් වහන්සේගේ එකම පුත්‍රයාණන් වූ සේක. එම නිසා ක්‍රිස්තුන් වහන්සේ ස්වර්ගීකය. උන්වහන්සේ තම දිවියේ දෙවියන් වහන්සේ ප්‍රධාන කර ගනිමින් දෙවියන් වහන්සේ තුළ ප්‍රාතිහාර්යයන් පෑ සේක. එසේම මිනිසා කෙතරම් උන්වහන්සේට විරුද්ධව පව් කළද, ගැරහුව ද උන්වහන්සේ අවසානය තෙක්ම මිනිසාට ප්‍රේම කළ සේක. සමාව දුන් සේක. උන්වහන්සේගේ සමාව දීමේ ගුණාංග කෙතරම් ද යත් තමාව පාවා දුන් ජුදාස්ට වුවද ජේසුස් වහන්සේ සමාව දුනි.

මෙය සාමන්‍ය මිනිසුනට කළ නොහැකි තරම් අසීරු කාර්යයකි. නමුත් මනුෂ්‍යයකු ලෙස මෙලොව වැඩ සිටි ජේසුස් වහන්සේ එසේ කරන ලද්දේ උන්වහන්සේගේ ස්වර්ගීක බව නිසාය.

**කවිෂ්කා විදුෂානි**
10 ශ්‍රේණිය
**සාන්ත මරියා දහම් පාසල - අවිස්සාවේල්ල**

## මලල ක්‍රීඩා ශූරියක්



මීග/ කටාන මරිය රාජිනී කනිටු විදුහලේ 5 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබනා ඩබ්ලිව්. ඒ . විශ්මි නීලියා ජෙලී දියණිය 2012 වසරේ අන්තර් නිවාසාන්තර මලල ක්‍රීඩා උත්සවයේදී වයස අවුරුදු 11 න් පහළ ශූරතාව දිනා ගැනීමට සමත් වුවාය.

කටාන, හල්පේ ශා. ප්‍රැන්සිස් සේවියර් මුනිඳුන්ගේ දේවස්ථාන දහම් පාසලේ ඉගෙනුම ලබනා ඇය අධ්‍යාපන කටයුතු වලට මෙන්ම ක්‍රීඩාවට ද එකසේ දස්කම් පාන්නීය. **(සිසිල් ඩැනීසියස් )**



# ලොව කිතුනු කලා අසිරිය

• මල් උයනේ දුඃඛප්‍රාප්තිය

1510 බර්ලින් කෞතුකාගාරය



• ස්වාමින් වහන්සේ තනිවීම

1530 - ඉතාලියේ වැලෙන්සියා දිව්‍ය සත්ප්‍රසාද විදුහල



• කුරුසියෙන් බෑමෙන් පසු

1527 - රුමේනියා බුඩාපෙස්ට් කෞතුකාගාරය



• කටු ඔටුන්න හිස පැළඳීම

1520 - බර්ලින් කෞතුකාගාරය



ජැන් ගො

(147

බෙල්ජියමේ ගම්
1478 දී උපත
ගොසාර්ට් සිය
මුල්කරගෙන ජ
හැඳින්වේ. ඉතා
ඔහුට ඉතාලියේ
පුනරුදයේ ආභ
ගැනීමට අවකා
1508 දී එනම්
එය අධ්‍යයනය
විවිධ නිර්මාණ
එළිදුටු අතර
අසිරියෙන් ඉදිරි
ජේසුස් ක්‍රිස්තුන්
ප්‍රාප්තියට අදළ
කළ සිතුවම් කිහි
ඔක්තෝබර් 01
ඔහු සගසුව දිනු



ගාසාර්ට්

8 - 1532 )

ම් බද පළාතක
ලද ජැන්
ගම් ප්‍රදේශය
ැන් මබුසේ ලෙසද
ලියට පැමිණි
් චිත්‍ර කලාවේ
ොෂය ලබා
ශ ලැබෙන අතර
තිස්වන වියේ සිට
ට මං පෑදේ.
රැසක් ඔහු වෙතින්
මවර කිතුනු කලා
පත් කැරෙනුයේ
වහන්සේගේ දුක්
ව ඔහු නිර්මාණය
ිපයකි. 1532
ද
ුවේ ය.



● කුරුසිය රැගෙන යෑම

1520 - 25



● ස්වාමින් වහන්සේට සරදම් කිරීම

1525 - බර්ලින් කෞතුකාගාරය



● ස්වාමින් වහන්සේට හිරිහැර කිරීම

1510 - බර්ලින් කෞතුකාගාරය

**ශිරාන් මෛත්‍රි විසිනි**



● විලාපයන් හා ලතෝනි

1520 - බර්ලින් කෞතුකාගාරය

# ඉංග්‍රීසි පාඩම
# විශේෂයෙන් අ.පො.ස. (සා. පෙළ හා උ. පෙළ) සිසු සිසුවියන් සඳහා



General English - Grammar Lessons by courtesy of ළමා ප්‍රදීපය

**ඉදිරිපත් කිරීම - මයිකල් ඇන්ජලෝ ප්‍රනාන්දු විසිනි.** **පාඩම් අංක : 48**

## Either / Neither

There are two books - පොත් දෙකක් තිබුණා
Either of them is interesting - ඉන් කොයි එකත් රසවත්.

**Either** කියන සහ **Niether** කියන වචන, ඒක වචන වරිනාකමක් ඇති වචන. බව මතක තබාගන්න. එයට ඒක වචන ක්‍රියාවක් යෙදිය යුතු නමුත් ඇතැම් අවස්ථාවලදී එය බහු වචනයක් ලෙස භාවිතා වන බවත් මතක තබා ගන්න.

**නිදසුන් :-**

Neither of these two books ***is good.***
Neither of these two books ***are good***. මේ දෙකම හරි
Neither of the children want to play.
Neither of the children wants to play. මේ දෙකම නිවැරදියි.
එහෙත් Neither පමණක් එක්ක නාම පදයක් යෙදුනත් එය ඒක වචන ස්වරූපය ගෙන තැබිය යුතුයි.

**නිදසුන්:**

Neither book ***was*** interesting. මේ පොත් එකක්වත් රසවත් නෑ.
Neither child ***has*** passed the exam. ළමයි දෙන්නගෙන් එක්කෙනෙක් වත් විභාගෙ පාස් නෑ.

You can buy either a pen or a shirt with this money.
ඔබට පෑනක් හරි කමිසයක් හරි ගන්න පුළුවන් මේ සල්ලි වලින්.
There are two hotels. හෝටල් දෙකක් තියෙනවා.
We can go to either. අපිට ඕනම එකෙට යන්න පුළුවන්.
Either is good. ඒ කෝකත් හොඳයි.

There are two guitars. ගිටාර් දෙකක් තියෙනවා.
One is green and the other is yellow. එකක් කොළපාටයි. අනික කහ පාටයි.

You can buy either the green guitar or the yellow guitar.
ඔබට කොළ පාට ගිටාරය හෝ කහ පාට ගිටාරය මිලදී ගත හැකියි.

Either is good. ඒ කෝකත් හොඳයි.

You can buy either. කෝක හරි ඔබට ගන්න පුළුවන්.

I like neither the green guitar nor the yellow guitar.
මම කොළපාට ගිටාරයටවත් කහපාට ගිටාරයටවත් කැමති නෑ. මෙවැනි වැකියකදී neither .... nor යන වචන අත්‍යවශ්‍යම වෙනවා.

I like neither. මම එකකටවත් කැමති නෑ

Neither is beautiful. එකක්වත් ලස්සන නෑ.

I like neither N'eliya nor Bandarawela.
මම නුවරඑළියටවත් බණ්ඩාරවෙලටවත් කැමති නෑ.

I like neither. මම ඒ කෝකටවත් කැමති නෑ.

I like neither Sunil nor Anil
මම සුනිල්ටවත් අනිල්ටවත් කැමති නෑ.

Both are lazy. දෙන්නම කම්මැලියි.

Either is lazy. (එක්එක්කෙනා තනි වශයෙන් ගත්තම කොයි කෙනත් කම්මැලියි)
I do not like either Sunil or Anil.
මම සුනිල්ටවත් අනිල්ටවත් කැමති නෑ.

මම දෙන්නාටම කැමති නෑ කියන අදහසම තමයි මේ වැකියෙනුත් කියැවෙන්නේ.

# දෙවිඳුණෝ දරුවන් අමතන්නාහ




**පරිවර්තනය - අති උතුම් ඔස්වල්ඩ් ගෝමිස් හිමි.**

දරු පරපුරට කතාන්දර මගින් යමක් කියාදීම ඉතා පහසුය. දරුවෝ කතාන්දර අසන්නට මහත් ආශාකරති. මේ නිසාම බයිබල් කතා පෙළක් කතෝලික දරු පරපුරට තිළිණ කරන්නට ''දෙවිඳුණෝ දරුවන් අමතන්නාහ'' ග්‍රන්ථය සමත්වී තිබේ. මෙහි වඩාත් සුවිශේෂී ලක්ෂණය නම් බයිබලයේ පැරණි ගිවිසුම හා නව ගිවිසුම ඇසුරු කරගෙන ඉදිරිපත් කර ඇති මේ සෑම කථාවක් සමගම වර්ණ ළමා චිත්‍රයක් අන්තර් ගත කිරීමයි මේ හේතුවෙන් ග්‍රන්ථයේ නිමාවටද ලැබී ඇත්තේ විශාල රුකුලකි.

මේ ග්‍රන්ථය සඳහා පැරණි ගිවිසුමෙ-න් සිද්ධීන් 45 ක් ද, නව ගිවිසුමෙන් සිද්ධීන් 53 ක්ද තෝරාගෙන තිබේ. පැවරීම, පාරාදීසය අහිමි වීම, කායින් සහ ආබෙල්, නොවා සහ ජලගැල්ම අලලා, කතා පහක් ඇතුළත්ය. ආබ්‍රහම් කැඳවීම, ආබ්‍රහම්ට දුන් පොරොන්දුව, ආබ්‍රහම්ගේ විශ්වාසය. ඊසාක් ඒසව් සහ ජාකොබ්, ජෝසප් මිසරයට පැමිණීම, ජාකොබ් හා දූතයෝ එහි පැමිණීම ඊළඟට දක්වා තිබේ. පැරණි ගිවිසුමේ ඊශ්‍රායෙල් ජනතාව වහල් භාවයෙන් මුදා ගැනීම අලලා මොසෙස්ගේ දූත කාරිය විස්තර කරන කතා 9ක් ඇතුළත්වේ.

ඊළඟට රජවරු හා දිවැසිවරු තේමාකර ගනිමින් කතාංගයන් 19 ක් දිග හැරෙන්නේ ළමා සිත් තුළ අපූර්වත්වයක් හා කුතුහලයද දනවමිනි. පැරණි ගිවිසුමේ ජනතාව මෙසියස් තුමා පැමිණෙන තුරු බලා සිටීම තේමා කර ගනිමින් කතාංග යන් 6 ක් මෙහි දැක්වේ. ජුදා ජනයෝ ජෝබ්, ජෝනා, ඇතුලු සිද්ධීන් ඒ ඔස්සේ ඉදිරිපත්කර තිබේ.




**ඔබත් සොයාගෙන කියවන්න**

මේ ග්‍රන්ථයේ ඊළඟට ඇත්තේ නව ගිවිසුම තුළින් බයිබල් කතා ඉදිපත් කිරීමය. එය ආරම්භ කරන්නේ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ ගැබ්ගැනීම මරියාවන් වෙත දැන්වූ මංගලම් කීමේ අවස්ථාවෙනි. පැරණි ගිවිසුමේ ජනතාව බලාපොරොත්තුව සිටි මෙසියස් තුමන්ගේ පැමිණීම මේ ඔස්සේ සනිටුහන් විය. ස්වාමින් වහන්සේගේ උපතේ සිට තිස් වසරක් දක්වා කාලසීමාව මේ කතාංගයක් ඔස්සේ පැහැදිලි කරයි.

ජේසුස් වහන්සේ ප්‍රසිද්ධ ජීවිතයේ ක්‍රියාකාරකම් හුවා දක්වමින් සමිදාණෝ උගන්වති. සුව කරති. වෙනස් වන්න මැය යටතේ කතාංග 14 ක් ඉදිරිපත් කර ඇත. ස්වාමින් වහන්සේගේ ප්‍රාතිහාර්යයන් සුවපත් කිරීම්, ශ්‍රාවකයන් තෝරාගැනීම ඇතුලුව ඉතා වැදගත් සිද්ධීන් මෙයට ඇතුළත්ය.

සමිදාණන් වහන්සේගේ ඉගැන්වීම් පෙළ ගැස්වීමට කතුවරයා උන්වහන්සේ දෙසු උපමා කතාන්දර හා සිද්ධීන් ඉදිරිපත් කරයි. ස්වාමි-න් වහන්සේගේ උකුත් වීම, තැන්පත් කිරීම හා උත්ථානයද , ස්වාමි-න් වහන්සේ තවමත් අපසමගය යන්න තහවුරු කැරෙන කතාංගයන් 07 ක්ද බයිබලය ඇසුරුකර මෙහි අන්තර්ගතය.

නූතන දරු පරපුරට පරිශීලනය සඳහා හරවත් එළදයි පත පොත නැතැයි මැසිවිලි නැගෙන සමයක දු දරුවන්ගේ කතාන්තර ඇසීමේ රුචියද නංවමින් බයිබලය ඒ ඔස්සේ ළමා පරපුර අතරට රැගෙන යැමට මෙවන් ග්‍රන්ථවලින් ලැබෙන රුකල අති මහත් බැව් නොකියාම බැරිය.

මෛත්‍රී

## මල්කඩුවාව දහම් පාසලේ අරමුදලට පොළක්



මල්කඩුවාව පාතිමා දහම් පාසලේ අරමුදල තර කරගැනීම සඳහා පොදු පොළක් පසුගිය ද ඉරුදින දිව්‍ය පූජාවෙන් අනතුරුව පාතිමා දෙව් මැදුර ඉදිරිපිටදී ඉතා සාර්ථකව පැවැත්විණි.

කුරුණෑගල මීසම් සේවක පියතුමන්ලාගේ අනුශාසකත්වය තුළ, දහම් ළමුන් ඇතුළු දෙමාපියන්ගේ සංවිධානයෙන් මෙම පොළ සංවිධානය කෙරෙනි, මීසම් සහයක ගරු ජාමික සුමේධ පියතුමන් ළමුන්ගෙන් ද්‍රව්‍ය මිළදී ගන්නා අයුරු සේයාරුවේ දැක්වේ. (සේයා හා සටහන :- ශානක)

# දිය ඇල්ලේ සුන්දරත්වය



**හර්ෂණ ප්‍රසාද්**
4 ශ්‍රේණිය
සා. ෆ්‍රැන්සිස් සේවියර් දහම් පාසල
සපුගස්කන්ද



**රසෝද්‍යා සයුරංග**
6 ශ්‍රේණිය
ශාන්ත ජෝශප් ශාඛා විදුහල
මීගමුව

**පුංචි අපේ චිත්‍ර පිටුව**

පුංචි අපේ චිත්‍ර පිටුව සඳහා ඔබ අඳින චිත්‍ර, පාසලේ හෝ දහම් පාසලේ පංතිභාර ගුරුතුමාගේ සහතිකය සමග ඔබේ නම. පංතිය. පාසල ඇතුළත්ව ඔබේ පෞද්ගලික ලිපිනය හා දුරකතන අංකය ද සහිතව යොමු කරන්න.

"පුංචි අපේ චිත්‍ර පිටුව"
ළමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.

**චාරුක දිනේෂ් මදුශාන්**
8 ශ්‍රේණිය
සාන්ත මරියා දහම් පාසල
නයිනමඩම







**කුවිශ්නි බැද්දගේ**
4 ශ්‍රේණිය
ශා. බ්‍රිජට් කන්‍යාරාමය
කොළඹ 07

**තරුෂිකා දෙව්මිණි**
2 ශ්‍රේණිය
පාතිමා මාතා දහම් පාසල
යායමුල්ල (වල්පිටගම මීසම)

**ක්ලෝඩියා මිහුරි ඇන්ජලා**
3 ශ්‍රේණිය
සියලු සාන්තුවරයන්ගේ බා.ම.වි.
බොරැල්ල



**දුලනක මනීෂ් සිල්වා**
3 ශ්‍රේණිය
ශාන්ත සෙබස්තියන් විදුහල
මොරටුව



**යශදි සේනාරත්න**
5 ශ්‍රේණිය
සාන්ත මරියා ප්‍රාථමික බාලිකා විදුහල
හලාවත





# ළමා ඔබත් ජේසුස් වහන්සේව අනුගමනය කරන දූතයෙක් වන්න......

**ආදරණීය නංගියේ මල්ලියේ,**
ජේසුස් වහන්සේ වැඩියෙන්ම ආදරය කරන්නේ, වැඩියෙන්ම එතුමා ළඟට එන්න ඉඩදුන්නේ කාටද? ''බාලයන් මා වෙතට එන්න ඉඩ හරින්න'' කියමින් ඒ ආරාධනය තුළ ජේසු වැඩියෙන්ම ආදරය කළේ පුංචි ළමුන්ට බව අප සැම දන්නවා. එතරම් ළමුන්ට ආදරය කළ ජේසුට පුංචි අපි දැක්විය යුතු ප්‍රති ආදරය කුමක්ද කියා අද පුංචි අප තුළ එතරම් වැටහීමක් නැහැ නේද?

ජේසුට අපි ආදරෙයි
ආදරෙයි ආදරෙයි
ජේසුට අපි ආදරේ නිසා
අපි සැම හොඳ ළමයින් වෙනවා ...



මෙම ළමා ගීතිකාව ඔබ අසා ඇති නේද ? මෙහි කියන ආකාරයටනංගිව අඩවන් නැතුව, මල්ලිට ගහල දුවන් නැතුව, සන්ඩු කරලා පැති ගන් නැතුව, පැරදුනාම තරහ නොවී, පන්තියේ වැඩ නොකර විහිලු කර කර ඉන් නැතුව, නැති බැරි අය දැක්කාම මග හැර යන් නැතුව, අනුන්ට නැති නම් හදන් නැතුව, ජේසුව අත් හරින්නේ නැතුව, අපි හොඳ ළමයින් වූ පමණින්ම ජේසුට ආදරෙයි කියලා අද අපි සිතනවා නේද? හොඳ ළමයෙක් වුනාමත් ජේසු සතුටු වෙනවා ඒක ඇත්ත, ඒත් ජේසු ගොඩාක් සතුටු වෙන්නේ ඔයාලා හැමෝම ජේසු වගේ, ජේසුව අනුගමනය කරන කුඩා ළමයෙක්, දූතයෙක් වුනාමයි.

දැන් අපි බලමු ජේසුව අනුගමනය කරන කුඩා ළමයෙක් , දූතයෙක් වන්නේ කොහොමද කියලා. මුලින්ම පුංචි නංගියේ මල්ලියේ, ජේසු තමන්ගේම ශ්‍රී ශරීරය හා ශ්‍රී රුධිරය අප සැමට පුප සහ මිදිරස ලෙස ලබාදෙමින්, එදා කල්වාරියේ ප්‍රේමයේ යාගය සිහිකරන දිව්‍ය පූජා යාගයට සැම ඉරු දිනකම සහභාගී වෙන්න ඕන. පූජාවේ කියවීම් වලට හොඳට ඇහුම්කන් දෙන්න ඕන, ගීතිකා, යාච්ඤා වලට ඉතා භක්තියෙන් සහභාගී වෙන්න ඕන. ජේසුස් වහන්සේ අප සැමට ලබා දුන් දෙව් පියාණන් වහන්සේට අප විසින් කරන උතුම්ම ප්‍රශංසාව දිව්‍ය පූජාවයි. ඔයාලගේ ආච්චිලා සීයලා තවමත් කොයිතරම් ආදරේකින්, සුදනමකින්, භක්තියෙන් දිව්‍ය පූජාවට සහභාගී වෙනවාද කියලා ඔයාලත් දකිනවා ඇති නේද? ඒ නිසා අම්මා, තාත්තා , අයියලා, අක්කලාවත් කොහොමහරි එකතුකරගෙන දිව්‍ය පූජාවට සහභාගීවෙලා ජේසුට ඒ උතුම්ම ප්‍රශංසාව ලබා දෙන්න.

දිව්‍ය පූජාව හැරුනාම ජේසුව අත්දකින්න, ජේසුගේ අඩිපාරේ යන්න, හොඳ ළමයෙක් වෙලා ජේසුව සතුටු කරන්න අපට උදව් කරන දේවල් ගොඩාක් තියෙනවා ඒවා මොනවාද කියලා ඔබ දන්නවාද?

ජේසුගැන දහම පිළිබඳව අපට කියා දෙන දහම් පාසල , ඒ දහම අප ජීවත් වන සමාජය තුළ අනෙක් අය සමඟ බෙදා ගන්න, ඒ විදිහට ජීවත් වෙන්න, අප තුළින් අනෙක් අයට ජේසුව අත්දකින්න සලස්වන්න උගන්වන ළ.ක්‍රි.වී. සමිතිය, ළමා ධර්මදූත සමාජය , යොවුන් සමිතිය වගේම , දිව්‍ය පූජාවේ අර්ථය තවත් වැඩිකරන්න උදව් වෙන පූජා උදව් සමිතිය, ගායනා කණ්ඩායම ආදී සමිති සමාගම් වලට පුංචි ඔයාලත් සම්බන්ධද? ඔයාලම හිතලා බලන්න........ මම කියපු නොකියපු මේ හැම සමිති සමාගමක්ම තුළින්ම අපි අත්දකින්නේ ජේසුව සහ එතුමන්ගේ අසීමිත ආදරයයි. දැනටමත් ඔබ මේවාට සම්බන්ධ වෙලා ඉන්නවානම්, තව තවත් උනන්දුවෙන්, ආදරෙන් ඒ සමිති සමාගම්වල දේවල් දේවල් කරන්න, ඒ වගේම අනිත් අයවත් යොමු කරවන්න. ඒ තුළින් ජේසුව අත් දකින්න, ජේසුව අනුගමනය කරන්න. මේ කිසිම දේකට සම්බන්ධ වෙලා නැත්නම් තවත් කල් දන්නැතුව ඔයාලගේ පල්ලියේ තියෙන සමිති සමාගම් වලට සම්බන්ධ වෙලා ජේසුගේ ආදරය අත්දකිමින්, ජේසුව අනුගමනය කරන පුංචි නංගියෙක් මල්ලියෙක් වෙන්න අදම හිතට ගන්න, ඒ දේ අද සිටම කරන බැව් පොරොන්දුව ජේසුට දෙන්න.

පල්ලියේ දෙවල් වලට නිතරම සම්බන්ධ වෙලා වැඩ කරන ළමයෙක් වැරදි පාරක යන්නැහැ. ජේසු ඒ හැමෝවම බලා ගන්නවා, ආරක්ෂා කරනවා, මග පෙන්-වනවා. ඉතින් ආදරණීය නංගියේ මල්ලියේ ඔයාලත් දිව්‍ය පූජාවට වගේම මේ සමිති සමාගම් වලට සම්බන්ධ වෙලා ජේසුස්-වහන්සේව අනුගමනය කරමින් එම අඩි පාරේ යන පුංචි දූතයෙක්, දූතිකාවක් වෙන්න. ඔයාලා හැමෝටම ඒ ආශීර්වාදය මඟ පෙන්වීම ලැබේවා.

**ශානක ක්‍රිසන්ත මුහන්දිරම්**
( සජීවක)
පාතිමා ධර්මදූත ළමා සමාජය
මල්කඩුවාව (කුරුණෑගල මීසම )

## ප්‍රහේළිකා අංක 29 පිළිතුරු

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 වැ | න් | 2 දෑ | ඹූ | 3 ව | |
| ස් | | හ | | තු | |
| 4 ස | ව | ස | | 5 ර | 6 ජ |
| | | ක් | | | රා |
| 7 ස | | | 8 ක | තා | ව |
| 9 වි | ශ් | වා | ස | | |

## ප්‍රහේළිකා අංක 29 - ජයග්‍රාහකයෝ

**1 වන ස්ථානය**
ශනිල්ත ප්‍රනාන්දු
9 ශ්‍රේණිය
පාතිමා දේව මාතා දහම් පාසල
මල්කඩුවාව (කුරුණෑගල මීසම)

**2 වන ස්ථානය**
සලනි හිරුණිකා
11 ශ්‍රේණිය
ක්‍රිස්තු රාජ දහම් පාසල - මෝදරවැල්ල (තල්විල මීසම)

**3 වන ස්ථානය**
පසිඳු නිර්මාල්
3 ශ්‍රේණිය
ද මැසිනොද් විදුහල - කඳන

## බයිබල් දැනුම මිනුම තරඟාවලියේදී රත්මලාන රෝ. කතෝලික විදුහල් ළමෝ දස්කම් පාති.

පිළියන්දල කලාපයේ රත්මලාන කොට්ඨාශයේ රජයේ පාසල් අතර කතෝලික ධර්මය ඉගෙනුම ලබන දරුවන් සඳහා දේවවචනය වසර වෙනුවෙන් පැවති බයිබල් දැනුම මිනුම තරගය පසුගියදා දෙහිවල ශා. මරියා විදුහලේදී පැවැත්වුණි .

මෙයට සහභාගිවූ රත්මලාන රෝමානු කතෝලික විදුහලේ ශිෂ්‍ය ශිෂ්‍යාවෝ 6,9,11 ශ්‍රේණියන් හි 3 වන ස්ථානය දිනාගැනීමට සමත්වූහ. **අසික ප්‍රියදර්ශන**

## ප්‍රහේළිකා අංක 30



( සැකසුම - තිළිණි දුතිකා පෙරේරා )

**හරහට**

1. ''අනුන් විනිශ්චය නොකරන්න. එවිට ඔබත් ............................ කරනු නොලැබේ. යනුවෙන් ක්‍රිස්තුන් වහන්සේ වදාල සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය.

3. නාස්තිකාර පුත්‍රයාගේ උපමාවේ බාල පුතා පසුතැවිලි වී ගෙදර ගිය පසු කරුණාවන්ත පියා ඉතා සංතෝෂ වී ඔහුව පිළිගෙන ......................... කළ වස්සා මරා භෝජන සංග්‍රහයක් පිළියෙල කළේය. හිස්තැනට සුදුසු වචනය

4. ඊශ්‍රායෙල් ජනතාව ගනුදෙනු කරන්නන් රවටන හොර .................... පාවිච්චි කරන බව පවසමින් අමොස් දිවැසිවරයා චෝදනා නැගුවේ ය. හිස්තැනට සුදුසු වචනය

7. දෙවියන් වහන්සේ මෙම දිවැසිවරයාට කැඳවූයේ ඔහු කුඩා කාලයේදීමය.

**පහළට**

1. ක්‍රිස්තුන් වහන්සේ කන්ද උඩ දේශනයේදී සැපත හා ........................... මෙය පිළිබඳව දේශනා කළ සේක.

2. ''මුලා නොවන්න නරක ආශ්‍රයෙන් හොඳ ............................. . නරක් වන්නේස'' යනුවෙන් ශු. පාවුළු තුමා පවසයි. මෙහි හිස්තැනට සුදුසු වචනය

5. ''මසුන් අල්ලන පිණිස .................... ගොස් දැල් හෙලන්නැ''යි ක්‍රිස්තුන් වහන්සේ සීමොන්ට වදාළ සේක මෙහි හිස්තැනට සුදුසු වචනය

6. ''වත ඉරාගෙන නොව සිත ඉරාගෙන නුඹේ දෙවි සමිඳුන් වෙත හැරී එන්න. ''යනුවෙන් මෙම දිවැසිවරයා තුළින් දෙවියන් වහන්සේ අපට ආරාධනා කරන සේක.

07. ආබ්‍රහම් තුමාගේ බිරිඳගේ නම .................

(මෙම ප්‍රහේළිකාව පිරවීමේදි පහත සඳහන් බයිබල් පාඨ උපයෝගී කරගත හැකිය. ශු. ලුක් 5/4, 6/37, 6/20, 15/30 , ආමොස් 7/4-6 , 1 සාමුවෙල් 3, උත්පත්ති 18, 1 කොරින්ති 15/ 33, ජෝවෙල් 2/13)


උත්ථානයේ අසිරිය
ඉදිරිපත් කිරීම - නාමල් ද සිල්වා -
.... සියලු වද වේදනා විඳ මරණයට පත් ජේසුස් වහන්සේගේ මෘත ශරීරය අරිමාතියේ ජෝසෙප් අළුත් සොහොන් ගැබෙහි තැන්පත් කර, දොරකඩට විශාල ගලක් තැබුවා.
ඉන්පසු එළඹුණු සතියේ පළමු දින හිමිදිරියේ මග්දලාහි මරියා සහ ජාකොබ්ගේ මව මරියා මෘත ශරීරයේ ආලේප කිරීම සඳහා සුවඳ ද්‍රව්‍යද රැගෙන සොහොන් ගැබ වෙත පියමැන්නා.
සියලු සුවඳ ද්‍රව්‍ය සූදානම් නේද මරියා..?
ඔව් මා සියල්ල අරගෙන ආවා!
සොහොන් ගැබ වෙත පැමිණි ඔවුන් දුටුවේ වසා තිබූ විශාල ගල සොහොන් ගෙයින් ඉවතට පෙරළලා තිබූ බවයි.
මොනවා...?
වසා තිබූ සොහොන් ගෙය කවුරුන් හෝ විවෘත කරලා.... අර බලන්න.... එයින් විශාල එළියක් විහිදෙනවා.
ඔවුන් දෙදෙනා සොහොන් ගැබට ඇතුළු වුවත් එහි ජේසුස් වහන්සේගේ ශරීරය තිබුණේ නැහැ. ඒ ගැන ඔවුන් වියවුල්ව සිටියදී ඒ අසල කාන්තිය විහිදුවන වස්ත්‍ර ඇඳගත් අයෙක් සිටිනු දුටුවා.
බිය නොවන්න_ ඔබ ජේසුස් වහන්සේ සොයන බව දනිමි. උන් වහන්සේ මෙහි නැත. උන්වහන්සේ වදාළ ලෙසම උත්ථාන වූ සේක.
ඒ ස්ත්‍රීන් ගලීලයට ගොස් සිදුවූ සියල්ල ශ්‍රාවකයින්ට පැවසුවත් මෙපුවත ප්‍රලාපයක් සේ ඔවුන් බැහැර කලා. එහෙත් පේදුරු නැගිට සොහොන් ගැබ කරා ගියා.
සැබෑවක්මයි! ජේසුස් වහන්සේගේ ශ්‍රී සළුව පමණයි මෙහි තිබෙන්නේ.
පසුව පේදුරු හා තවත් ගෝලයෙක් එම්මාවුස් නම් ගමට යමින් සිටියා. මගදී තවත් අමුත්තෙක් ඔවුන්ට හමු වුනා.
නුඹලා කථා කරන්නේ කුමක් ගැනද?
නාසරෙත්හි ජේසුස් වහන්සේ පිළිබඳ කාරණයයි
එම අමුත්තා ඔවුන් සමඟ රාත්‍රී කෑම ගත්තා. කෑමට හිඳගත් කල්හි රොටි ගෙන ආශිර්වාදය පවසා කඩා ඔවුන්ට දුන්නා.
එවිට ගෝලයින් ජේසුස් වහන්සේව හඳුනා ගත්තා. එවිට උන්වහන්සේ අතුරුදහන් වුනා.
ඔබට ශාන්තිය වේවා!
ගෝලයින් එකෙණෙහිම නැගිට ජෙරුසෙලමට ගොස් ශ්‍රාවකයින් හා අනෙක් සියලු දෙනාට ස්වාමීන් වහන්සේ උත්ථාන වූ පුවත පවසා සිටියා.

ශුද්ධ ලියැවිල්ලේ දිවැසිවර චරිතාපදාන ළමා ප්‍රදීපය ඔබ වෙත රැගෙන එයි

සිව් වන කොටස

# දිවැසිවර එලියා

සැකසුම : තිළිණ අලහකෝන්

